## WEATHER FORECAST FOR 24th May 2018
**(Issued at 05.30 a.m. on 24th May 2018)**

**Prevailing rainy condition in the South-western part of the island is expected to continue.**

Showers or thundershowers will occur at times in Western, Southern, Sabaragamuwa, Central and North-Western provinces.

Showers or thundershowers will occur elsewhere, particularly after 2.00 p.m.

Showers or thundershowers will occur in Jaffna, Mannar and Mullaitivu districts in the morning too.

Heavy falls, about 100-150 mm can be expected at some places in Sabaragamuwa, Western, Central and North-western provinces and in Galle, Matara districts.

Fairly heavy falls, above 50 mm can be expected at some places in Northern province.

**There may be temporary localized strong winds during thundershowers. General public is kindly requested to take adequate precautions to minimize damages caused by lightning activity.**

දිවයිනේ නිරිත දිග කොටසේ පවතින වැසි සහිත කාලගුණ තත්ත්වය තවදුරටත් බලාපොරොත්තුවේ.

බස්නාහිර, දකුණු, සබරගමුව, මධ්‍යම සහ වයඹ පළාත්වල විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වේ.

සෙසු පළාත්වල විශේෂයෙන් සවස 2.00 න් පසු වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වේ.

යාපනය, මන්නාරම සහ මුලතිව් දිස්ත්‍රික්කවල උදෑසන කාලයේදීත් වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වේ.

සබරගමුව, බස්නාහිර, මධ්‍යම සහ වයඹ පළාත්වලත් ගාල්ල සහ මාතර දිස්ත්‍රික්කවලත් ඇතැම් ස්ථානවලට මි.මී.100-150 ක පමණ තද වැසි ඇති විය හැක.

උතුරු පළාතේ ඇතැම් ස්ථානවලට මි.මී.50 ට වැඩි තරමක තද වැසි ඇති විය හැක.

ගිගුරුම් සහිත වැසි ඇති වන විට එම ප්‍රදේශවල තාවකාලිකව තද සුළං ඇති විය හැක. අකුණු මඟින් සිදුවන අනතුරු අවම කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ජනතාවගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

## WEATHER FORECAST FOR SEA AREAS AROUND THE ISLAND DURING NEXT 24 HOURS (Issued at 05.30 a.m. on 24th May 2018)

**Windy and showery conditions are expected to enhance in the Western and southern sea areas from today.**

Showers or thundershowers will occur at times in the sea areas around the island.

Heavy showers can be expected at some places, particularly in the sea area extending from Kankasanturai to Mathara via Mannar, Colombo and Galle.

Winds will be Westerly to South-westerly in direction in the sea areas around the island and wind speed will be 30-40 kmph.

**Sea area extending from Mannar to Potuvil via Puttalam, Colombo, Galle and Hambantota can be rough or very rough at times as the wind speed can increase up to 60-70 kmph at times.**

**Temporarily very strong gusty winds (up to 70-80 kmph) and rough seas can be expected during thundershowers. Navel and fishing communities are also requested to be vigilant in this regards.**

## ඉදිරි පැය 24 සඳහා දිවයින වටා ඇති මුහුදේ කාලගුණ තත්ත්වය
**2018 මැයි මස 24 වන දින උදෑසන 05.30 ට නිකුත් කරන ලදි.**

**දිවයිනට බස්නාහිර සහ දකුණු දෙසින් වන මුහුදු ප්‍රදේශවල වැසි සහ සුළං තත්වයේ වැඩි වීමක්, අද දින සිට බලාපොරොත්තුවේ.**

දිවයින වටා මුහුදු ප්‍රදේශවල විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වේ.

ඇතැම් ස්ථානවලට, විශේෂයෙන් කන්කසන්තුරය සිට මන්නාරම, කොළඹ සහ ගාල්ල හරහා මාතර දක්වා වන මුහුදු ප්‍රදේශවල තද වැසි ඇතිවීමේ හැකියාවක්ද පවතී.

දිවයින වටා වන මුහුදු ප්‍රදේශවල සුළං බටහිර සිට නිරිත දක්වා වූ දිශා වලින් හමන අතර සුළගේ වේගය පැ.කි.මී. 30-40 ක් පමණ වේ.

**මන්නාරම සිට පුත්තලම, කොළඹ, ගාල්ල සහ හම්බන්තොට හරහා පොතුවිල් දක්වා වන මුහුදු ප්‍රදේශවල සුළගේ වේගය විටින් විට පැ.කි.මී. 60-70 දක්වා වැඩි විය හැකි අතර එවිට එම මුහුදු ප්‍රදේශ රළු හෝ ඉතා රළු විය හැක.**

ගිගුරුම් සහිත වැසි ඇති වන විට එම ප්‍රදේශවල තාවකාලිකව ඉතා තද සුළං (පැ.කි.මී. 70-80 දක්වා) ඇති විය හැකි අතර එවිට එම මුහුදු ප්‍රදේශ තාවකාලිකව රළු විය හැක.

ධීවර සහ නාවුක ප්‍රජාවට මේ පිළිබඳව ඉතා අවධානයෙන් කටයුතු කරන ලෙසත් ඉල්ලා සිටිනු ලැබේ.

EMERGENCY OPERATIONS DIVISION
RECEIVED
Date : 2018/05/24
Time : 0540 hrs
D (Ops)/DO/ADO
DISASTER MANAGEMENT CENTRE

කාලගුණ විද්‍යාඥ (Duty Meteorologist),
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව (Department of Meteorology)